| 06368 | දකුණු | ගාල්ල | ගා/රිපන් බාලිකා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 |
| 06371 | දකුණු | ගාල්ල | ගා/ශාන්ත ඇලෝසියස් විද්‍යාලය | 3 | 0 | 2 | 0 | 1 | 0 | 3 | 0 | 0 | 0 |
| 06373 | දකුණු | ගාල්ල | ගා/විද්‍යාලෝක විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 06392 | දකුණු | ගාල්ල | ගා/මානවිල උපනන්ද විද්‍යාලය | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 06393 | දකුණු | ගාල්ල | ගා/මීපාවල අමරසූරිය විද්‍යාලය | 2 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 |
| 06457 | දකුණු | ගාල්ල | ගා/කතළුව මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 |
| 06459 | දකුණු | ගාල්ල | ගා/බටේමුල්ල ජාතික පාසල | 1 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 06496 | දකුණු | ගාල්ල | ගා/ගිංතොට සහිරා ජාතික පාසල | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 06497 | දකුණු | ගාල්ල | ගා/මල්හරුස්සුල්හියා මහා විද්‍යාලය | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 06511 | දකුණු | ගාල්ල | ගා/ලබුදූව සිරිධම්ම මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 07017 | දකුණු | මාතර | මාර/මොරවක කීර්ති අබේවික්‍රම ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 1 | 0 | 3 | 0 | 0 | 0 |
| 07029 | දකුණු | මාතර | මාර/කොටපොල මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 |
| 07041 | දකුණු | මාතර | මාර/ඌරුබොක්ක මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 |
| 07055 | දකුණු | මාතර | මාර/දෙනියාය මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 07071 | දකුණු | මාතර | මාර/තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 07104 | දකුණු | මාතර | මාර/ගොඩපිටිය මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |
| 07146 | දකුණු | මාතර | මාර/කඹුරුපිටිය නාරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 |
| 07162 | දකුණු | මාතර | මාර/ තිහගොඩ මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 3 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 |
| 07225 | දකුණු | මාතර | මාර/ දෙයියන්දර මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |
| 07258 | දකුණු | මාතර | මාර/වැලිගම සිද්ධාර්ථ විද්‍යාලය | 2 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 07272 | දකුණු | මාතර | මාර/වැලිගම සුමංගල බාලිකා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 07283 | දකුණු | මාතර | මාර/වැලිගම අරෆා මධ්‍ය මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 |
| 07317 | දකුණු | මාතර | මාර/ශාන්ත තෝමස් පිරිමි විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 07328 | දකුණු | මාතර | මාර/ශාන්ත සර්වේෂස් විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 07383 | දකුණු | මාතර | මාර/දික්වැල්ල විජිත මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 07394 | දකුණු | මාතර | මා/දික්වැල්ල මින්හාත් ජාතික පාසල | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 |
| 07406 | දකුණු | මාතර | මා/මහින්ද රාජපක්ෂ විද්‍යාලය | 3 | 0 | 0 | 0 | 1 | 0 | 3 | 0 | 1 | 0 |
| 08001 | දකුණු | හම්බන්තොට | හ/වලස්මුල්ල ජාතික පාසල | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 08002 | දකුණු | හම්බන්තොට | හ/කටුවන මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 08038 | දකුණු | හම්බන්තොට | හ/වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 08073 | දකුණු | හම්බන්තොට | හ/තංගල්ල පිරිමි ජාතික පාසල | 2 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 08074 | දකුණු | හම්බන්තොට | හ/තංගල්ල බාලිකා මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 08106 | දකුණු | හම්බන්තොට | හ/හුංගම විජයබා ජාතික පාසල | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 08112 | දකුණු | හම්බන්තොට | හ/අඟුණකොළපැලැස්ස මහානාග ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 08144 | දකුණු | හම්බන්තොට | හ/ගැටමාන්න විජය ජාතික පාසල | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 08229 | දකුණු | හම්බන්තොට | හ/දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 08275 | දකුණු | හම්බන්තොට | හ/ථෙරපුත්ත ජාතික පාසල | 2 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 08276 | දකුණු | හම්බන්තොට | හ/ශාන්ත මේරි ජාතික පාසල | 4 | 0 | 0 | 0 | 3 | 0 | 2 | 0 | 0 | 0 |
| 08280 | දකුණු | හම්බන්තොට | හ/සහිරා මුස්ලිම් ජාතික පාසල | 0 | 3 | 0 | 0 | 0 | 2 | 0 | 2 | 0 | 1 |
| 08339 | දකුණු | හම්බන්තොට | හ/තංගල්ල රුහුණු විජයබා ජාතික පාසල | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 08340 | දකුණු | හම්බන්තොට | හ/සුචී ජාතික පාසල | 3 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 08346 | දකුණු | හම්බන්තොට | හ/වීරකැටිය ශ්‍රී ලංකා සිංගප්පූරු මිත්‍රත්ව විදුහල | 3 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 09166 | උතුරු | යාපනය | යා/මනිපායි හින්දු විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 09269 | උතුරු | යාපනය | යා/නෙල්ලිඅඩි මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 09353 | උතුරු | යාපනය | යා/චාවකච්චේරිය හිංදු විද්‍යාලය | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 09416 | උතුරු | යාපනය | යාපනය හිංදු විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 09456 | උතුරු | යාපනය | යාපනය මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 09457 | උතුරු | යාපනය | යා/ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 09465 | උතුරු | යාපනය | යා/වේම්බඩි උසස් කාන්තා විද්‍යාලය | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 10001 | උතුරු | කිලිනොච්චි | කිලිනොච්චි මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 10011 | උතුරු | කිලිනොච්චි | කිලිනොච්චි මුලංකාවිල් මහා විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11001 | උතුරු | මන්නාරම | මන්නාරම සිත්තිවිනායගර් හිංදු විද්‍යාලය | 0 | 3 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 | 0 |
| 11002 | උතුරු | මන්නාරම | මන්නාරම ශාන්ත සේවියර් පිරිමි විද්‍යාලය | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11003 | උතුරු | මන්නාරම | මන්නාරම ශාන්ත සේවියර් බාලිකා විද්‍යාලය | 0 | 3 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 | 0 |
| 11025 | උතුරු | මන්නාරම | මන්නාරම අල්-අස්හර් මහා විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12003 | උතුරු | මුලතිව් | මුලතිව් විද්‍යානන්ද විද්‍යාලය | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 19097 | උතුරු | මුලතිව් | මුලතිව් සම්පත්නුවර විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 |
| 13001 | උතුරු | වව්නියාව | වවුනියාව රම්බෛකුලම් බාලිකා මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 |
| 13002 | උතුරු | වව්නියාව | වවුනියා දෙමළ මධ්‍ය මහා විද්‍යාලය | 0 | 3 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 13004 | උතුරු | වව්නියාව | වවුනියා මුස්ලිම් මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 13110 | උතුරු | වව්නියාව | වවුනියාව ගාමිණී ජාතික පාසල | 1 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |
| 13111 | උතුරු | වව්නියාව | වවුනියාව මඩුකන්ද ජාතික පාසල | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 | 0 |
| 14018 | නැගෙනහිර | මඩකලපුව | මඩ/ඔඩ්ඩමාවඩි ජාතික පාසල | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 0 | 0 |
| 14022 | නැගෙනහිර | මඩකලපුව | මඩ/වාලච්චේනෛ අන්-නූර් ජාතික පාසල | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 14081 | නැගෙනහිර | මඩකලපුව | එරාවූර් අලිගාර් මධ්‍ය මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 14115 | නැගෙනහිර | මඩකලපුව | මඩකලපුව වින්සන්ට් උසස් බාලිකා විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 14117 | නැගෙනහිර | මඩකලපුව | මඩකලපුව ශාන්ත මයිකල් විද්‍යාලය | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 14118 | නැගෙනහිර | මඩකලපුව | මඩකලපුව ශාන්ත සිසිලියා කාන්තා විද්‍යාලය | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 14129 | නැගෙනහිර | මඩකලපුව | මඩකලපුව ශිවානන්ද ජාතික පාසල | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 14145 | නැගෙනහිර | මඩකලපුව | කාත්තන්කුඩි මධ්‍ය මහා විද්‍යාලය | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 14147 | නැගෙනහිර | මඩකලපුව | කාත්තන්කුඩි මීරා බාලිකා මහා විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 14185 | නැගෙනහිර | මඩකලපුව | කලවංචිකුඩි පද්දිරුප්පු මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 3 | 0 | 1 |
| 15002 | නැගෙනහිර | අම්පාර | අම්/පදියතලාව ජාතික පාසල | 1 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |
| 15067 | නැගෙනහිර | අම්පාර | අම්/ඩී.එස්.සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 0 | 0 | 2 | 0 | 3 | 0 | 0 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 15152 | නැගෙනහිර | අම්පාර | දෙහිඅත්තකණ්ඩිය මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 |
| 15202 | නැගෙනහිර | අම්පාර | කල්මුණේ කාමෙල් ෆාතිමා විද්‍යාලය | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 2 |
| 15248 | නැගෙනහිර | අම්පාර | අඩ්ඩාලච්චේනයි මධ්‍ය මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 |
| 15265 | නැගෙනහිර | අම්පාර | නින්දවූර් අල්-අෂ්රක් මධ්‍ය මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 15290 | නැගෙනහිර | අම්පාර | අක්කෙරයිපත්තු ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය | 0 | 4 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 15291 | නැගෙනහිර | අම්පාර | තිරුක්කෝවිල් තම්ලුවිල් මධ්‍ය මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| 16054 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ත්‍රි/ශ්‍රී ෂන්මුග හින්දු කාන්තා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| 16057 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය සිංහල මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 2 | 0 | 2 | 0 | 1 | 0 |
| 16059 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ත්‍රි/රාජකීය විද්‍යාලෝක විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 |
| 16068 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ත්‍රි/ශාන්ත මේරි විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 16073 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ත්‍රි/ශාන්ත ජෝසප් විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 16121 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කන්තලේ අග්‍රබෝධි ජාතික පාසල | 2 | 0 | 0 | 0 | 2 | 0 | 3 | 0 | 1 | 0 |
| 16175 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | මුතූර් මධ්‍ය මහා විද්‍යාලය | 0 | 4 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 16187 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කින්නියා මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17001 | වයඹ | කුරුණෑගල | පොල්ගහවෙල පරාක්‍රමබාහු මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17094 | වයඹ | කුරුණෑගල | කුරු/මාවතගම මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |
| 17095 | වයඹ | කුරුණෑගල | කුරු/ශ්‍රී නිශ්ශංක මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 17141 | වයඹ | කුරුණෑගල | කුරුණෑගල වාරියපොල සුමංගල මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17199 | වයඹ | කුරුණෑගල | ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17265 | වයඹ | කුරුණෑගල | නාරම්මල මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 17293 | වයඹ | කුරුණෑගල | කුරු/මලියදේව පිරිමි විද්‍යාලය | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17352 | වයඹ | කුරුණෑගල | කුරු/පරගහදෙණිය ජාතික පාසල | 0 | 1 | 0 | 2 | 0 | 2 | 0 | 3 | 0 | 2 |
| 17361 | වයඹ | කුරුණෑගල | අලව්ව ශ්‍රී රාහුල මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 17391 | වයඹ | කුරුණෑගල | බිංගිරිය ශ්‍රී සරණංකර මධ්‍ය මහා විද්‍යාලය | 4 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 |
| 17464 | වයඹ | කුරුණෑගල | කුරු/දුම්මලසූරිය ජේ.ආර්. ජයවර්ධන මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 |
| 17489 | වයඹ | කුරුණෑගල | කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17522 | වයඹ | කුරුණෑගල | කුරු/සඳලංකා ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 |
| 17549 | වයඹ | කුරුණෑගල | ගිරිඋල්ල වික්‍රමශිලා ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 |
| 17550 | වයඹ | කුරුණෑගල | කුරු/පන්නල ජාතික පාසල | 3 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 |
| 17613 | වයඹ | කුරුණෑගල | පඬුවස්නුවර එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17664 | වයඹ | කුරුණෑගල | කුරු/සියඹලාගස්කොටුව මදීනා ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 |
| 17675 | වයඹ | කුරුණෑගල | කුරු/පොල්පිතිගම ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 17708 | වයඹ | කුරුණෑගල | කුරු/ මහව විජයබා මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17757 | වයඹ | කුරුණෑගල | කුරු/ගල්ගමුව යූ.බී. වන්නිනායක ජාතික පාසල | 3 | 0 | 2 | 0 | 2 | 0 | 2 | 0 | 2 | 0 |
| 17767 | වයඹ | කුරුණෑගල | කුරු/පැරකුම්පුර ජාතික පාසල | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 17771 | වයඹ | කුරුණෑගල | කුරු/ මීගලෑව මහවැලි ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 |
| 17867 | වයඹ | කුරුණෑගල | කොබෙයිගනේ ශ්‍රී පරාක්‍රම ජාතික පාසල | 0 | 0 | 1 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 18072 | වයඹ | පුත්තලම | පුත්තලම ආනන්ද ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 |
| 18073 | වයඹ | පුත්තලම | පුත්තලම සහිරා ජාතික පාසල | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 0 |
| 18091 | වයඹ | පුත්තලම | කල්පිටිය අල් අක්ෂා ජාතික පාසල | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 |
| 18199 | වයඹ | පුත්තලම | හලාවත ආනන්ද ජාතික පාසල | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 |
| 18218 | වයඹ | පුත්තලම | මාදම්පේ සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 |
| 18243 | වයඹ | පුත්තලම | වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලය | 2 | 0 | 2 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 |
| 18302 | වයඹ | පුත්තලම | නාත්තන්ඩිය ධම්මිස්සර මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 19001 | උතුරුමැද | අනුරාධපුරය | මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | 3 | 0 | 0 | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 |
| 19361 | උතුරුමැද | අනුරාධපුරය | අනු/එප්පාවල ශ්‍රී සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 |
| 19429 | උතුරුමැද | අනුරාධපුරය | අනු/කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 19487 | උතුරුමැද | අනුරාධපුරය | අනු/සහිරා මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 20001 | උතුරුමැද | පොළොන්නරුව | පො/මින්නේරිය ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |
| 20002 | උතුරුමැද | පොළොන්නරුව | පො/හිගුරක්ගොඩ ආනන්ද බාලිකා ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 1 | 0 | 4 | 0 | 1 | 0 |
| 20035 | උතුරුමැද | පොළොන්නරුව | පො/මැදිරිගිරිය ජාතික පාසල | 5 | 0 | 2 | 0 | 2 | 0 | 3 | 0 | 1 | 0 |
| 20069 | උතුරුමැද | පොළොන්නරුව | පොලොන්නරුව රාජකීය ජාතික පාසල | 2 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 21001 | ඌව | බදුල්ල | මහියංගණය ආඳාඋල්පත මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 21026 | ඌව | බදුල්ල | මහියංගනය ජාතික පාසල | 4 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |
| 21071 | ඌව | බදුල්ල | බ/කන්දෙගෙදර ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 |
| 21102 | ඌව | බදුල්ල | බ/වියළුව ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |
| 21105 | ඌව | බදුල්ල | බ/මීගහකිවුල ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |
| 21191 | ඌව | බදුල්ල | බ/ඇටම්පිටිය ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |
| 21239 | ඌව | බදුල්ල | බණ්ඩාරවෙල හල්පෙ මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 |
| 21277 | ඌව | බදුල්ල | බ/හල්දුම්මුල්ල වල්හපුතැන්න ජාතික පාසල | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 21280 | ඌව | බදුල්ල | බ/කොස්ලන්ද මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 21311 | ඌව | බදුල්ල | බ/වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 21464 | ඌව | බදුල්ල | බ/සරස්වතී දෙමළ මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 21511 | ඌව | බදුල්ල | බ/පස්සර දෙමළ මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 |
| 22001 | ඌව | මොණරාගල | බිබිල වෙල්ලස්ස ජාතික පාසල | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22005 | ඌව | මොණරාගල | මො/ මැදගම ජාතික පාසල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 22086 | ඌව | මොණරාගල | මොණරාගල රාජකීය විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22149 | ඌව | මොණරාගල | බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 |
| 23001 | සබරගමුව | රත්නපුරය | ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 23061 | සබරගමුව | රත්නපුරය | ර/සුමන බාලිකා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 0 | 0 |
| 23062 | සබරගමුව | රත්නපුරය | ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල | 3 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 23068 | සබරගමුව | රත්නපුරය | ර/ජේසු බිළිඳාගේ කන්‍යාරාමය | 1 | 0 | 1 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 23123 | සබරගමුව | රත්නපුරය | පැල්මඩුල්ල ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 23247 | සබරගමුව | රත්නපුරය | ර/ගොඩකවෙල රාහුල මධ්‍ය මහා විද්‍යාලය | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 23319 | සබරගමුව | රත්නපුරය | ර/කරවිට මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 23400 | සබරගමුව | රත්නපුරය | ර/කලවාන මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 2 | 0 |
| 23431 | සබරගමුව | රත්නපුරය | ර/කොළොන්න මධ්‍ය මහා විද්‍යාලය | 3 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 |
| 23559 | සබරගමුව | රත්නපුරය | බලංගොඩ ජෙයිලානි මුස්ලිම් මහා විද්‍යාලය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 |
| 24042 | සබරගමුව | කැගල්ල | යටියන්තොට මධ්‍ය මහා විද්‍යාලය | 4 | 0 | 2 | 0 | 3 | 0 | 3 | 0 | 1 | 0 |

| පාසලේ සංගණන අංකය | පළාත | දිස්ත්‍රික්කය | පාසලේ නම | පළමු භාෂාව | | දෙවන භාෂාව | | ඉතිහාසය | | භූගෝලය/ පුරවැසි අධ්‍යාපනය | | උපදේශනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් | සිංහල මාධ්‍යය පාසල් | දෙමළ මාධ්‍යය පාසල් |
| 24066 | සබරගමුව | කෑගල්ල | කෑ/දෙහිඕවිට මහා විද්‍යාලය | 2 | 0 | 2 | 0 | 0 | 0 | 2 | 0 | 2 | 0 |
| 24112 | සබරගමුව | කෑගල්ල | කෑ/දැරණියගල සිරිසමන් මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 24158 | සබරගමුව | කෑගල්ල | කෑ/පින්දෙනිය මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 1 | 0 | 2 | 0 | 2 | 0 |
| 24228 | සබරගමුව | කෑගල්ල | රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 1 | 0 | 2 | 0 | 3 | 0 | 1 | 0 |
| 24321 | සබරගමුව | කෑගල්ල | කෑ/පින්නවල මධ්‍ය මහා විද්‍යාලය | 2 | 0 | 2 | 0 | 1 | 0 | 2 | 0 | 2 | 0 |
| 24343 | සබරගමුව | කෑගල්ල | කෑ/මාවනැල්ල සහිරා මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය | 0 | 5 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 2 |
| 24355 | සබරගමුව | කෑගල්ල | කෑ/මාවනැල්ල මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 |
| 24504 | සබරගමුව | කෑගල්ල | කෑ/ශාන්ත මේරි මහා විද්‍යාලය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 0 | 2 | 0 |
| 24577 | සබරගමුව | කෑගල්ල | කෑ/තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| එකතුව | | | | 265 | 81 | 251 | 56 | 165 | 27 | 229 | 76 | 89 | 30 |

05-681/2

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණිය සඳහා වෘත්තීය සුදුසුකම් හා කුසලතා මත සෘජු බඳවා ගැනීම - 2016

අංක 1670/33 සහ 2010.09.10 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.4 ඡේදයේ පරිදි ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරු සඳහා වෘත්තීය සුදුසුකම් හා කුසලතා මත සෘජු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම්පත් 2018 ජුනි 25 දින හෝ එදිනට පෙර, කොළඹ 07, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා සෘජු බඳවා ගැනීමේ අයදුම්පත** යනුවෙන් සඳහන් කළ යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ගණකාධිකාරී සේවයේ වෘත්තීය සුදුසුකම් මත කුසලතා පදනමින් III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු 35 ට නොවැඩි සංඛ්‍යාවකට පත් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරීන් තෝරාගනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය හැක.

03. *සේවා කොන්දේසි* :
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1670/33 සහ 2010.09.10 දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරනලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලබයි.

(i) මෙම පත්වීම ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද ඔබ වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 අනුව භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස් වලටද, ඒවාට අදාලව වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද, මෙම පත්වීම යටත්වේ.

04. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL 1-2016 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට - රු. 47,615 - 10x1,335 - 8 x 1,630 -17 x2,170 - රු.110,895 ක මාසික වැටුප් පරිමාණය හිමි වේ.
(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

05. *වෘත්තීය සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය,

*හෝ*

(ii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක අවසාන පරීක්ෂණය,

*හෝ*

(iii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක අවසාන පරීක්ෂණය,

*හෝ*

(iv) සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය,

*හෝ*

(v) එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අවසාන පරීක්ෂණය සමත්ව තිබිය යුතුය.

06. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

07. *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 7.4.2.6 (iii) පරිදි සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv) *සුදුසුකම් ලබන දිනය* :
සේවයට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍යවන සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

08. *වයස් සීමාව* :
නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

09. පහත සඳහන් ලියවිලි අපේක්ෂකයෙකු විසින් සිය අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. :

(*අ*) උප්පැන්න සහතිකයේ පිටපතක්,
(*ආ*) ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල පිටපත්,
(*ඇ*) චරිත සහතික 2 ක් (මෙයින් එකක් විදුහල්පතිගෙන්/විශ්ව විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.)

10. කුසලතා මත සෘජු බඳවා ගැනීමේ දී ව්‍යුහගත ලකුණුදීමේ පරිපාටිය :

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | *වෘත්තීය සුදුසුකම්* : | | |
| | (i) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වානිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු විය යුතුය. | 15 | 50 |
| | (ii) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර් මාධ්‍යය පරීක්ෂණය, ගිණුම්කරන හා ව්‍යාපාරික සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර, වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය, සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය I වැනි කොටසේ පරීක්ෂණය සමත් වීම. | 20 | |
| | (iii) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය සමත් වීම, වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ වෘත්තීය II වැනි කොටසේ පරීක්ෂණය සමත් වීම. | 30 | |
| | (iv) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ | 40 | |

| අනු. අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් | | |
| | (v) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් | 50 | |
| 02. | අධ්‍යාපන සුදුසුකම් : | | 25 |
| | (i) සාමාන්‍ය උපාධිය - සාමාන්‍ය සාමාර්ථ | 10 | |
| | (ii) විශේෂ උපාධිය - සාමාන්‍ය සාමාර්ථ | 12 | |
| | (iii) 2 වැනි පෙළ සහිත සාමාන්‍ය උපාධිය | 12 | |
| | (iv) 2 වැනි පෙළ සහිත විශේෂ උපාධිය | 13 | |
| | (v) 1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය | 13 | |
| | (vi) 1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය | 15 | |
| | (vii) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රාජ්‍ය මූල්‍ය කළමණාකරනය, මූල්‍ය කළමණාකරනය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වානිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමණාකරන, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමණාකරනය යන අදාළ ක්ෂේත්‍ර) | 17 | |
| | (viii) පශ්චාත් උපාධි - නිබන්ධන රහිත (රාජ්‍ය මූල්‍ය කළමණාකරනය, මූල්‍ය කළමණාකරනය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වානිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමණාකරන, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමණාකරනය යන අදාළ ක්ෂේත්‍ර) | 20 | |
| | (ix) පශ්චාත් උපාධි - නිබන්ධන සහිත (රාජ්‍ය මූල්‍ය කළමණාකරනය, මූල්‍ය කළමණාකරනය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වානිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමණාකරන, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමණාකරනය යන අදාළ ක්ෂේත්‍ර) | 25 | |
| 03. | පළපුරුද්ද : වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව ලබාගත් පළපුරුද්ද මෙහිදී සළකා බලනු ලැබේ. වර්ෂයකට ලකුණු 05 බැගින් වර්ෂ 4ක පළපුරුද්දට ලකුණු 20ක් මෙහිදී ලබාදෙනු ලබයි. | | 20 |
| 04. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා : සම්මුඛ පරීක්ෂණයට මුහුණදීමේදී දක්වන කුසලතාවය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන පරිදි මෙම ලකුණු ප්‍රදානය කරනු ලැබේ. | | 05 |
| | එකතුව | | 100 |

11. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත නිලධාරියෙකු විසින් තමාගේ අයදුම්පතෙහි මුල් පිටපත ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් "**ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07**" යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. එහි පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම කෙලින්ම මෙම ලිපිනයට යොමු කල හැකිය.

12. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක අපේක්ෂකයා විසින්ම සකස් කළ යුතුය.

(ආ) ඉල්ලුම්පතේ අංක 01 සිට 05 දක්වා කරුණු මුල් පිටුවේ සඳහන් කළයුතුය. ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේ වෙතත් ඉල්ලුම් පත්‍රය සකස් කරන විට එහි ශීර්ෂය රාජ්‍ය භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර නොමැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ පිළිබඳව කෙරෙන අභියාචනා කිසිවක් සලකා බලනු නොලැබේ.

(ඈ) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේනැතිනම් යම් වැදගත් කරුණක් ඔහු /ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම්, පත්වීමක් ලැබීමට ඔහු/ඇය නුසුදුස්සකු වීමට ඉඩ ඇත. රජයේ සේවයට පත්කළ පසුව මෙබන්දක් හෙළිවුවහොත් සේවයෙන් පහකළ හැකිය.

13. පත්වීම් ක්‍රියාත්මක වන දිනය හා පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ.කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

14. තෝරාගනු ලබන අපේක්ෂකයෙකු තුන් අවුරුදු පරිවාස කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීමට පෙර පහත සඳහන් විෂයයන් ගෙන් සමන්විත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.
   (i) රජයේ මූල්‍ය පරිපාටිය
   (ii) නීතිය හා කළමනාකරණය
   (iii) පරිපාලනය
   (iv) වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළ කිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ.රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2018 මැයි මස 05 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුර වෘත්තීය සුදුසුකම් හා කුසලතා මත ඍජු බඳවා ගැනීම - 2016

## DIRECT RECRUITMENT TO THE GRADE III OF SRI LANKA ACCOUNTANT'S SERVICE ON MERIT AS PER PROFESSIONAL QUALIFICATION - 2016

අංකය : [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

| |
|---|
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය : [ ]<br>සිංහල - 1, දෙමළ - 2, ඉංග්‍රීසි -3<br><br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. |

01) 1.1 මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Mr. PERERA, D.T.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02) 2.1 ස්ථිර ලිපිනය :————.

2.2 රාජකාරී ලිපිනය :————.
(රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු විසින් ඔහුගේ රාජකාරී ලිපිනය ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වූයේ නම්, එය වහාම දැන්විය යුතුය.)

2.3 දුරකථන අංකය :————.

03) 3.1 උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.2 නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

04) ස්ත්‍රී/පුරුෂ භාවය :

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|

05) විවාහක/අවිවාහක බව :

| විවාහක | අවිවාහක |
|---|---|

06) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 05 යටතේ දැක්වෙන මූලික සුදුසුකම ලබාගැනීම පිළිබඳ විස්තරය

| සුදුසුකම | ලබාගත් ආයතනය | ලබාගත් දිනය |
|---|---|---|
| ......................... | ..................................... | ......................... |
| ......................... | ..................................... | ......................... |

07) භාෂා ප්‍රවීණතාවය පිළිබඳ සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :

| (i) සිංහල | (ii) දෙමළ | (iii) ඉංග්‍රීසි |
|---|---|---|
| | | |
| | | |

08) අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් - (ලබාගන්නා ලද ඉහළම උපාධි, අදාළ ආයතනවල නම්, පන්තියක් වේ නම් එය, ඒවායේ දින සහ පෙනී සිටි විෂයයන්, වෘත්තීය සුදුසුකම්වල විස්තර සඳහන් කරන්න. සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍යවන සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.)

| අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් | ආයතනය | සාමාර්ථය ( පන්තිය) | වලංගු දිනය | විෂයයන් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

09) දැනට නිරත රක්ෂාව සහ ඊට ප්‍රථමයෙන් ඉසිලූ තනතුරු :- රක්ෂාවට බැඳුණු දිනය, ඉන් අස්වූ දිනය, වාර්ෂික වැටුප හා සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න .(සේවා පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍යවන සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.)

| තනතුරු | සිට | දක්වා | වාර්ෂික වැටුප (රුපියල්) | සේවය අවසන් කිරීමට හේතු |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

10) ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලබා තිබේද? එසේනම් දිනය සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :————.

11) තවත් තොරතුරු කිසිවක් වේනම්, ඒවා :————.

12) චරිත සහතික ලබාගන්නා අය හැර ඔබ ගැන තොරතුරු විමසිය හැකි ඔබ ගැන හොඳින් දන්නා පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න.

(1)

(2)

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමටත්, කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

අයදුම්කරු රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නම් ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .................................................................. නැමැති අයදුම්කරු .............................................වැනි දින සිට ......................................... දක්වා මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත් මෙයින් සහතික කරමි.

————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :————.

05-768

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන් යටතේ බඳවාගත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා තරග විභාගය-2018

උපාධිධාරීන් රැකියාගත කිරීම සඳහා ඇරඹි වැඩසටහන් යටතේ සංවර්ධන සහකාර, සැලසුම්/මුල්‍ය සහකාර හා සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලබා මෙම අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ජාතික පාසල්, ගුරු විද්‍යාල හා විද්‍යා පීඨවල සේවය කරන, නිලධාරීන්ගෙන් ජාතික පාසල්වල පවතින 6-11 වසර වල ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් 2011.12.07 දිනැති 11/2260/504/179-I අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඳවාගත් උපාධිධාරී වැඩසටහන, 2005 වසරේ උපාධිධාරී පුහුණු වැඩසටහන හා 2008 වසරේ තරුණ අරුණ III වැඩසටහන යටතේ බඳවාගත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ජාතික පාසල්, ගුරු විද්‍යාල, විද්‍යාපීඨවල සේවය කරන සංවර්ධන සහකාර, සැලසුම්/මුල්‍ය සහකාර හා සංවර්ධන නිලධාරීන් විය යුතුය.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර මෙම *ගැසට්* නිවේදනයේ 7.4 වගන්තියෙහි සඳහන් උපදෙස් පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.06.22 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1 සියලුම අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයට පෙනී සිටිය යුතුය. එම විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් වෘත්තීයේ දී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ 13 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ඇත. අයදුම්කරු විසින් ලිඛිත විභාගයේ දී හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා මුලු ලකුණු වල ප්‍රමුඛතාවය මත පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.3 මෙම *ගැසට්* නිවේදනයට අදාළ පුරප්පාඩු උපලේඛනය 02 හි සඳහන් වේ. උපලේඛනයේ සඳහන් ගුරු පුරප්පාඩු පවතින පාසල් සඳහා පමණක් බඳවා ගැනීම සිදුකරනු ලබන අතර එම පාසල්වල සේවය කිරීමට කැමති අයදුම්කරුවන් තම මනාප අනුපිළිවෙල අනුව පාසල් නම් කළ යුතුවේ. එක් අයදුම්කරුවකුට ඉල්ලුම් කළ හැකි උපරිම පාසල් සංඛ්‍යාව තුනක් පමණක් බව සැලකිය යුතුය.

*සටහන* :

පාසල් පාදක ක්‍රමය අනුව සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු වලට ප්‍රමුඛතාවය දෙනු ලැබේ. එමෙන්ම එකම පාසලකට ඉල්ලා ඇති අයදුම්කරුවන් කිහිපදෙනකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවකදී අයදුම්කරුගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට එම පාසලට ඇති දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන වන බැවින් වසර 08 ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්විය යුතුය.

(iii) 2007-07-01 දිනට පසු රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලැබූ නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත්වේ.

(v) 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ටද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ටද රාජ්‍ය සේවයේ පත්වීම් වලට අදාළ පොදු කොන්දේසි වලටද මෙම පත්වීම යටත් වනු ඇත.

04. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව G-E-01-2016 හි රු. 27,740-300X6-380X7-445X2-රු.33,090/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන සුදුසුකම්* :

5.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ලබා ගත් උපාධියක් තිබිය යුතුය.

5.2 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

***සටහන***- විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ.) විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකිය.

06. *වෙනත් සුදුසුකම්* :-

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

07. *අයදුම්කිරීමේ ක්‍රමය* :

7.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතුය. 1.0 සිට 3.5 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේද ඉතිරි ශීර්ෂ දෙවන පිටුවේද වන පරිදි විභාගයට ඉල්ලුම් කරන මාධ්‍යයෙන්ම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

7.2 *විභාග පරිපාටිය* :

(i) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

(ii) සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යම විය යුතුය.

(iii) අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) සෑම අයදුම්කරුවකුම ප්‍රශ්න පත්‍ර දෙක (02)ටම පෙනී සිටිය යුතුය.
(v) බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

7.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

7.4 අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

7.5 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2018.06.22 වැනි දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ., 1503 කොළඹ," යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩ සටහන් යටතේ බඳවාගත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා තරග විභාගය -2018" ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

7.6 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත්‍රය නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ.

7.7 අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත්ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය 0112784232 දරන ෆැක්ස් අංකය මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

08. *විභාගයට පෙනී සිටීම* :

8.1 නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්,අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර ලැබෙනසේ යොමු කොට ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. මෙහිදී *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇතිඅය පමණක් ඉල්ලුම් කර ඇතැයි උපකල්පනය කෙරේ.විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කොට විභාගයට පෙනී සිටිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

8.2 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.-* අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇත බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :
තමා පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍ර ය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*
අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලය තුළදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරුවකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ.

11. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :*
මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන්ම කොළඹ දී පවත්වනු ලැබේ. අයදුම්කරනු ලබන මාධ්‍යයෙන් විභාගය සඳහා ඉදිරිපත් වීම අනිවාර්ය වේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සාමාර්ථ්‍ය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගැනීම අනිවාර්යය වේ.

12. *විෂය නිර්දේශය :-*
මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. සියලුම අයදුම්කරුවන් එම ප්‍රශ්න පත්‍ර දෙක සඳහා පෙනී සිටීම අනිවාර්යය වේ.

01. අභියෝග්‍යතාව - කාලය පැය 01 යි (ලකුණු 100 යි)
අයදුම්කරු සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

02. සාමාන්‍ය දැනීම - කාලය පැය 01යි. (ලකුණු 100 යි)
ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

13. ප්‍රායෝගික පරීක්ෂණය
අධ්‍යාපන විෂයය භාර රේඛිය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ අයදුම්කරු හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05 කට නොඅඩු කාලයක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. උපරිම ලකුණු 25 ක් හිමිවන අතර ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම පහත සඳහන් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලිබව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

14. *විභාග ගාස්තු :*

14.1 විභාග ගාස්තුව රු. 600/-කි, ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි ඕනෑම තැපැල් /උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේම නමට ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න, (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) (මෙම විභාග ගාස්තු වලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව සළකන්න.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

14.2 ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

15. අයදුම්පත පිරවීම සඳහා උපදෙස්
අයදුම්පත පිරවීමේදී පහත උපලේඛන 1 හා 2, පමණක් භාවිතා කරන්න.

උපලේඛන 01

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |

16. අයදුම්පත්‍රයේ අංක 9.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

17. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

18. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

19. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතුවේ.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්.

2018 මැයි මස 03 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

***අධ්‍යාපන අමාත්‍යාංශය***

*දිවයිනේ ජාතික පාසල්වල පවතින 6-11 වසරවල විෂයය යටතේ ඇති සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ බඳවා ගත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2018*

Appointment of graduates (recruited under the programme to employ graduates) to grade 3 - I (a) of Sri Lanka Teachers' Service for vacancies in Sinhala and Tamil medium teaching existing in national schools of the island - 2018

බඳවාගත් උපාධිධාරී වැඩ සටහන හා තනතුර (කොටුවේ අදාළ අංකය යොදන්න) :

| | |
|---|---|
| 2005 උපාධිධාරී පුහුණු වැඩසටහන | 1 |
| 2008 තරුණ අරුණ III වැඩසටහන | 2 |
| 2011 -12-07 දිනැති 11/22060/504/179-I අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඳවාගත් උපාධිධාරී වැඩසටහන | 3 |

[ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) :
සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3

[ ]

උපලේඛනය -2 හි සඳහන් පරිදි ඉල්ලුම් කරනු ලබන පාසලට ලබා දී ඇති අනුක්‍රමික අංකය මෙන්ම පාසල් මනාපයේ අනුපිළිවෙළ අනුව මෙහි සටහන් කරන්න.

| මනාප අනුපිළිවෙළ | පාසලට ලබාදී ඇති සංගණන අංකය | පාසලේ නම |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා :-AMRAKOON MUDIYANSELAGE NAMAL HERATH) :————.

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (උදා :- HERATH.A.M.N.) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

3.0

3.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.2 විවාහක අවිවාහක බව : අවිවාහක -1 විවාහක -2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.4 2018.06.22 දිනට වයස : අවු. : [ | ] මාස : [ | ] දින : [ | ]

3.5 ස්ත්‍රී/පුරුෂභාවය : (ස්ත්‍රී-1 පුරුෂ-0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) : [ ]

